# සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව - 2025.11.28 දින මහ සභ රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 01. | ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා | - ගරු සභාපති |
| 02. | පී.කේ. අසංක ඉදුනිල් මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. | ජී.එම්. සුනිල් ප්‍රේමරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. | ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 01. | ජී. ශනිකා ප්‍රියදර්ශනි මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |
| 02. | කේ.එම්.ධර්මදාස බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03. | ආර්.එම්. අජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. | කේ.එම්. අජිත් පුෂ්ප නන්දන මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. | කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. | එල්.එච්.හර්ෂනි මධුමාලී මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |
| 07. | ඩබ්.ඒ. පුෂ්පජිත් මධුසංඛ අමරසිංහ මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. | එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. | කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. | ඩී.එම්. මධුරාණි දිසානායක මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |
| 15. | ආර්.එම්. හේමලතා මැණිකේ මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |
| 16. | එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. | ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |
| 18. | ඩබ්.පී.සමන් වර්ණකුලසූරිය මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. | කේ.එම් ගුනරත්න මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. | පී.පී.ජී.නදිකා මැතිතුමිය | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ටී.ඩබ්. උපාලි වසන්ත කුමාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02. | බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03. | එම්.ඒ. චාන්දන බණ්ඩාර මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. | ආර්. එම්. අබේපාල මැතිතුමා | - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

## සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව - 2025.11.28 දින මහ සභ රැස්වීම් වාර්තාව

සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාවේ 2025 නොවැම්බර් මස 28 වන දින මාසික සභා රැස්වීමේ කටයුතු පෙරවරු 9.20 ට ගරු සභාපති ඩබ්ලිව්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා විසින් මුලසුන හොබවමින් ආරම්භ කරන ලදි. එහි දි ගරු උප සභාපතිතුමා ඇතුළුව අද දින මහ සභා රැස්වීමට සහභාගි වන සියලු මන්ත්‍රී මණ්ඩලය පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. මීළගට යෙදි තිබුණේ,

**01. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රනුකූලව පසුගිය මස මහ සභා වාර්තාව කියෙව්වා සේ සලකා සභා සම්මත කර ගැනිමේ අවස්ථාව පළමුව සභාවට දැනුම් දෙන ලදි. ඒ අනුව ගරු කේ.එම්. අජිත් පුෂ්පනන්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව ගරු ජී. ශනිකා ප්‍රියදර්ශනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි. මෙම වාර්තාවේ අඩු පාඩු දෝෂ ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් ඒවා සභා සම්මත කර ගන්නා ලෙසත් සභාවට දැනුම් දෙන ලදි.අඩුපාඩු හා සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය. ඉන් අනතුරුව 2025.11.13 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සම්මත කර ගැනිමේ අවස්ථාව සභාවට ලබාදෙන ලදි. ගරු උප සභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා විසින් 2025.11.13 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සම්මත කිරීම සුදුසු බවට කල යෝජනාව ගරු ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. මෙම වාර්තාවේද අඩුපාඩු හා සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ අතර, එම වාර්තාව ද ඒකමතිකව සභා සම්මත විය.

මුලින්ම අද දින මහ සභාවට පැමිණීමට නොහැකි බව දන්වා තිබෙන සභික මහත්ම මහත්මින් පිළිබඳව සභාවට නිවේදනය කරන ලදි. ගරු බී.බී.සිරිත් ප්‍රියදර්ශන පෙරේරා මැතිතුමා අද දින අසනිප තත්වයක් හේතුවෙන් නොපැමිණෙන බව දන්වා ඇත. මීළගට එළඹියේ ,

**02. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම් හා පැමිණිළි හා සන්නිවේදන සභාගත කිරිම.**

2025.08.05 දින මානහරණ වසමේ ප්‍රදේශවාසින් විසින් මානහරණ වසමේ බොරලු පාරවල් සංවර්ධනය කිරීම ශ්‍රමදාන මට්ටමින් සිදු කළ බවත්, ජලය බැස යන කාණු පද්ධතියට කුණු දැමීම නිසා කාණු ගොඩවීම මත මාර්ගය අබලන් වී ඇති බවත්, මෙම ක්‍රියාවන් නැවැත්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බවට මානාහරණ ප්‍රදේශ වාසින් විසින් සංදේශයක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව ගරු සභාපති ඩබ්ලිව් .වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

මීළගට ගරු සභාපති ඩබ්ලිව්. වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා ප්‍රකාශ කලේ සභාවේ මන්ත්‍රීවරුන්ට සභා ගත කළ යුතු යෝජනා තිබේ නම් ඉදිරිපත් කරන ලෙසයි.

**ගරු කේ. එම්. වසන්ත රංජිත් කුමාර මැතිතුමා.**

''ගරු සභාපතිතුමා සහ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා තුමියන්ලාගෙන් අවසරයි. මෙවැනි ප්‍රශ්න ප්‍රදේශයේ බොහෝ වසම් වල තිබෙනවා. බොහෝ ගම්වල මිනිස්සු පාරට කුණු දමනවා. මෙම යෝජනාව අනුව ගමේ මිනිසුන් ශ්‍රමදාන කිරීමට අවශ්‍ය වාහන හා ඉන්ධන ලබා දීමට හැකි නම් එය වඩාත් පහසු වෙනවා. හදිසි ආපදා තත්වයක් මත ආපදාවට ලක් වු පුද්ගලයින් සිටි නම් අප විසින් කළ හැකි උදව් උපකාර කරනවා. ඌරා ඔය ප්‍රදේශයේ පුද්ගලයෙකු දියේ ගිලී මිය ගොස් ඇති අතර, ඒ පවුලට අපිට යමක් කළ හැකි නම් කළ යුතු වෙනවා'' යැයි පවසන ලදි.

තවද එතුමා පැවැසුවේ ''ප්‍රාදේශීය සභාවේ වාහනයක් පැය 24 තුළම හදිසි ආපදා තත්වයකදී ක්‍රියාත්මක වෙනවා නම් ගොඩක් හොදයි. මේ සඳහා JCB යන්ත්‍රය භාවිතා කල හැකියි'' යනුවෙන් පවසන ලදී.

**03 ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන ඉදිරිපත් කිරිම.**

ඩෙංගු මර්ධන වැඩ සටහන දෙසැම්බර් මුල් සතියේ සිට මාර්තු මුල් සතිය දක්වා සති 14 ක කාලයක් කොට්ඨාස 14 ක් වශයෙන් ගෙන වසම් මට්ටමෙන් ඩෙංගු මර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අප සැලැසුම්

කරලා තිබෙනවා.. මේ සඳහා ඔබ සැමගේ දායකත්වය අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා අපි ක්‍රියාත්මක වෙනවා.

**04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න** – නැත

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා** - ඇත

**01. 2025 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කමිටුවක් පත් කිරීම.**

ආයතනයේ සියලු භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට විෂය භාර නිලධාරී ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. 1988 මූල්‍ය හා පරිපාලන රීති අනුව, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරීන් දෙදෙනෙක් හා අප ආයතනයේ නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් කළ යුතුය. එම යෝජනාව ගරු උප සභාපති පී. කේ. අසංක ඉදුනිල් මැතිතුමා ගරු සභාපති තුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති තුමා විසින් විවාද අවස්ථාව සභාවට ලබා දෙන ලදි.

<u>**ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා.**</u>

භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමේදි ලෙජරයෙන් ඉවත් කිරීමට අවශ්‍ය අබලි ද්‍රව්‍ය විශාල වශයෙන් තියෙනවා. ඒවා ලෙජරයෙන් ඉවත් කර මෙම වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය නිවැරදිව කළ යුතුය.

<u>**ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා**</u>

භාණ්ඩ සමීක්ෂණය සඳහා භාජනය කරන සියලු වත්කම් අපිට හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුයි කියා මම කියනවා.

<u>**ගරු උප සභාපති පී.කේ. අසංක ඉදුනිල් මැතිතුමා**</u>

භාණ්ඩ සමීක්ෂණයට අදාළ සංයුතිය අනුව සභාව නියෝජනය කරමින් එක් සභිකවරයෙක්, නිලධාරීන් ඇතුළු හත් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් යෝජනා කරනවා. ඒ සඳහා අවශ්‍ය නිලධාරී නාමකරණය මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදි යෝජනා කර ගත යුතුය.

<u>**ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා**</u>

විවාද අවස්ථාව අවසන් කරන අතර, ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ කණ්ඩායම මේ ආකාරයෙන් සිදු කර ගමු. මෙම යෝජනාව සඳහා සභාවේ එකඟතාවය විමසන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.ඉදිරි කටයුතු ඒ අනුව සිදු කර ගමු.

**02. ත්‍රී රෝද රථ ගාල් සංවර්ධනය කිරීමේ යෝජනාව**

මෙම යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. මෙම ත්‍රී රෝද රථ ගාල සංවර්ධනය කිරීමේ යෝජනාව මීට පෙර ද අපි සාකච්ජා කලා. දැනට කොට්ඨාසය තුළ අපිළිවෙල සහගත බව ඉවත් කරලා, ජනතාවට සහනදායි ලෙස මාර්ගය භාවිතා කිරීමට අපි කටයුතු කරමු.

- ► ලියාපදිංචි කර ඇති ත්‍රී රෝද රථ සඳහා ස්ටිකර් ලබා දීම.(මේ සම්බන්ධයෙන් මුල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ දි සාකච්ජාවට භාජනය කර ගමු)
- ► ත්‍රී රෝද රථ ගාලක තිබිය යුතු සංයුතිය
- ► ත්‍රී රෝද රථ ලියාපදිංචිය ක්‍රමවත් කිරීම

## සියඹලාණ්ඩුව ප්‍රාදේශිය සභාව - 2025.11.28 දින මහ සභ රැස්වීම් වාර්තාව

මීලගට එළඹියේ කුලී ගමන් රථ සඳහා භාවිතා කරන සියළු ත්‍රී රෝද රථ සඳහා නාම පුවරු හා ස්ටිකර් සකස් කිරීමට මුදල් යෙදවීමට සභාවේ අනුමැතිය ගැනීමේ අවස්ථාවයි. ඒ සඳහා අදහස් තිබේ නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදි.

ගරු සභාපතිතුමා විසින් විවාද අවස්ථාව සභාවට දෙන ලදී.

**<u>ගරු කේ. එම්. වසන්ත රංජිත් කුමාර මැතිතුමා</u>**

මෙම යෝජනාව හොඳයි. අනුමැතිය ලත් හෝ නොලත් ත්‍රී රෝද රථ තියෙනවා. සියළුම ත්‍රී රෝද රථ අලුතින් ම ලියාපදිංචි කිරීම සුදුසු යැයි යෝජනා කරනවා.

**<u>ගරු එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා</u>**

මේ සඳහා පැහැදිලි නියාමනයක් අවශ්‍යයි. ත්‍රී රෝද රථ සංගම් වෙනම ලියාපදිංචි කරගෙන තිබෙනවා. මේ සඳහා වෘත්තීමය වශයෙන් මෙන්ම විවේක වේලාවට පමණක් එන ත්‍රී රෝද රථ වශයෙන් කොටස් දෙකකට වෙන් කර තිබෙනවා. එම ත්‍රී රෝද රථ ගාල් පිළිබඳව පැහැදිලි අදහසක් නෑ. මේ සම්බන්ධයෙන් පැහැදිලි නියාමනයක් කර ක්‍රියාත්මක කිරීම යෝග්‍ය යැයි ප්‍රකාශ කරනවා.

**<u>ගරු ආර්. එම්. ඉන්ද්‍රාවති මැතිණිය</u>**

ජනතාව පීඩනයට පත් නොකොට ත්‍රී රෝද රථවල මීටරයක් සවි කර හෝ මුදල් අය කිරීම් සම්බන්ධව ඔවුන් දැනුවත් කරලා නියාමනයක් කිරීම හොඳයි කියලා මම යෝජනා කරනවා. නැතිනම් මහජනතාව බොහෝ අපහසුතාවයන්ට පත්වෙන අවස්ථා තිබෙනවා.

**<u>ගරු උප සභාපති පී. කේ. අසංක ඉඳුනිල් මැතිතුමා</u>**

පසුගිය සභා වාරයේදීත් මේ සම්බන්ධව අපි පැහැදිලි කිරීමක් කළා. කොහොම වුනත් ගරු සභාපති තුමනි, දැන් අපි මෙම කාරණයේ යම් තාක් දුරට ගිහින් ඉන්නේ. මෙහිදි අපි කිව්වොත් ත්‍රී රෝද රථ ගාල් දැනට හඳුනා ගැනිම. දැනට වෘත්තියක් ලෙස ත්‍රී රෝද රථ භාවිතා කරන්නන් හඳුනාගානිමේ කාරණය යම් මට්ටමකට අපි සිදු කරමින් ඉන්නේ. මෙහිදි සභාපති තුමා විසින් ගෙන එන යෝජනාව සිද්ධ වෙන්නේ මෙම ක්‍රියාවලිය කර ගෙන යැමෙදි හඳුනා ගන්න අය වෙන් කර ගන්න අවශ්‍යතාවය ඇති නිසා. මෙහිදි විශේෂයෙන් කියන්න ඕන සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුද්ගලික හා වෘත්තිමය වශයෙන් කොටස් දෙකක් බෙදා වෙන් වි තිබෙනවා. එබැවින් මෙම දෙක කළමනාකරණය කර ගැනීමට සිද්ධ වෙනවා. ඒ වගේම ගරු මන්ත්‍රී වරයෙක් කලින් අදහස් දැක්වූවා අපිට බැරිද ගාස්තු අයකර ගන්න කියලා. මේකෙදි මූල්‍ය සංසරණය වෙන්නේ මේ ආකාරයට තමයි, මන්ත්‍රී තුමා අපි අයකරනු ලබන මුදල් සභා අරමුදලට තමයි එකතු වෙන්නේ. අතරමැදදි එම මුදල් වියදම් කරලා ඉතුරු මුදල් ටික සභා අරමුදලට දැම්මේ හැකියාවක් නැහැ. ඒ නිසා අපට කළ හැක්කේ අපි එකතු කරන ගාස්තුව හෝ ඒ වෙනුවෙන් ගන්නා බදු මුදල් සභා අරමුදලට යොදවා එතැනින් තමයි අපට වියදම් කරන්න වෙන්නේ. ගරු ඉන්ද්‍රාණි මන්ත්‍රීතුමිය ප්‍රකාශ කල ආකාරයට අනිවාර්යෙන්ම අපිට සිදුවනවා ගාස්තු නියාමනයකට යැමට. එතුමිය සඳහන් කළ කතාව ඇත්ත. සියඹලාණ්ඩුව ජාතික මට්ටමේ තිබෙන ත්‍රී රෝද සංගමයන් අභිබවා තමයි මෙහි ගාස්තු අය කිරීම සිදු කරනු ලබන්නේ. විශේෂයෙන්ම මේ පාලනය සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු කර ගැනීමට සිද්ධ වෙන්නේ ඔන්න ඔය කියන කාරණා නිසා. මිනිසුන් ඉතා පීඩාවට පත් කරමින් තමයි අපේ බල ප්‍රදේශයේ බොහෝ ත්‍රී රෝද රථ හිමියන් එම කටයුත්ත සිදු කරන්නේ. අපිට ලැබිල තිබෙන බලතල වලත් සඳහන් වෙන්නේ මහජනතාවට පීඩාවකට පත් වෙනවා නම් ඒ සම්බන්ධව සෘජුව කටයුතු කිරීමට සිදු වෙන බවයි. මෙම සියළු කරුණු කාරණා අරගෙන සියළු ත්‍රී රෝද රථ සම්බන්ධයෙන් අපිට ප්‍රාදේශීය සභාවක් විදිහට මැදිහත් වෙන්න වෙයි. ඔවුන් නියාමනයෙන් පසුව නිසි ආකාරව සේවය සපයනවා නම් බල ප්‍රදේශයේ මහජනතාවට අපට සිද්ධ වෙනවා පෙරලා එම වෘත්තිකයන් රැක බලා ගැනීමට හා එම වෘත්තිකයන් සඳහා අවශ්‍ය පොදු පහසුකම් ප්‍රමාණය ප්‍රාද්ශීය සභාව විදිහට මැදිහත් ව ඉටු කරන්න. ඒ වගේම වෘත්තීය ගෞරව වෙනුවෙන් පෙනි සිටින්න වෙයි වගේම ත්‍රී රෝද ගාල් සම්බන්ධයෙන් ද පෙනි සිටින්න වෙන අතර, ඒ අයගේ කැලි කසල හෝ වේවා එතන තිබෙන ආලෝකකරනය වේවා යනාදි කාරණා

සම්බන්ධයෙන් අපට නිරන්තරව අවධානය යොමු කරන්න වෙයි. මේ සියලු කාරණා පෙර දැරී කරගෙන තමයි අපි වැඩ සටහන ක්‍රියාත්මක කරන්නේ. ඒ වගේම අපි නොදකින තවත් කාරණයක් තිබෙනවා ඔබ දන්නා විෂ මත්ද්‍රව්‍ය කාරණය. එය සංවිධානාත්මක දූෂිත අයුරින් අපේ රටේ පැතිර තිබෙනවා. මෙහිදී එක් පුරුකක් ලෙස බුද්ධි අංශ හඳුනාගෙන තිබෙනවා මේ ත්‍රී රෝද රථ හිමි සුළුතරයක්.එයත් නියාමනය කල හැක්කේ ඔවුන්ගේ පාලන අධිකාරිය සභාවක් විදිහට අපේ අතට ගැනීමෙන්. ත්‍රී රෝද රථ ගාස්තු හා සමාජයට අහිතකර දේවල්

සම්බන්ධයෙන් ත්‍රී රෝද රථ ගාස්තු හා සංවර්ධන වැඩ පිළිවෙල ගේන්න වෙලා තිබෙන්නේ. ඉතින් ගරු සභාපති තුමනි, මෙහි තොරතුරු සොයා ගැනීමේ දී සභාවක් විදිහට සියළු දෙනාගේ එකගතාවයෙන් මෙය සිදු කර ගත යුතුය.

<u>ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා.</u>

ආපදාවට ලක් වී ඇති අවස්ථාවක සභාව පැවැත්වීමට හැකිවීමත්, සතුටට කරුණක්. මෙම යෝජනාව වැදගත්. මෙහි පළමු අදියර විදිහට සභාවට ත්‍රී රෝද රථ සංගම්වල පාලනය යටත් කරගෙන ත්‍රී රෝද රථ සංගම්වල ආචාර ධර්මවල නියාමනය සිදු කළ හැකිය. විෂ මත්ද්‍රව්‍ය වෙළදාම වළක්වා ගැනිමට ත්‍රී රෝද රථ රියදුරන් යොදවා ගත හැකිය. මොවුන් ළග මේ පිළිබද දැනුවත් භාවයක් තිබෙනවා. සභාවේ පාලනයට නතු කරගෙන මෙය සිදු කරමු. ඉදිරියේදි ත්‍රී රෝද රථ වල ගමන් කරන පුද්ගලයින්ගෙන් කාන්තාවන්ගේ ආරක්ෂාව සලසා ගැනිමත් මෙහිදි කළ හැකිය. මෙය හොද වැඩ සටහනක්. මෙය ඉදිරියටත් පවත්වා ගෙන යමු.

<u>ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් සාධනීය අදහස් දැක්වූවා. තවත් යෝජනා තිබේ නම් අදහස් දැක්වීමේ අවස්ථාව තිබෙනවා. අදහස් ඉදිරිපත් කරන්න.

<u>ගරු ඩබ්. පී. සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>

ත්‍රී රෝද රථ ගාල් ක්‍රමවත් කිරීම හොදයි. මීට පෙර මෙම වැඩ සටහන ආරම්භ කිරීමේ දි වැරදි විදිහට වටහා ගත් අයත් සිටියා. මෙයින් බැහැර වූ අයත් හිටියා. සමහර තැන් වල ත්‍රී රෝද ගාල් සංවර්ධනයේ අකටයුතු කම් සිදු වුණා. මෙය නියාමනය කර සභාවේ බලය යොදා ගෙන ත්‍රී රෝද ගාල් ස්ථාන ගත කරන්න ඕන. මෙය ප්‍රදේශයේ කළ යුතු දෙයක්. ප්‍රාදේශීය සභාවක් ලෙස කටයුතු කරන්න. අපි සියළු දෙනාම සහයෝගය ලබා දීමට කටයුතු කරමු. සමහර නගරවල ත්‍රී රෝද ගාල් යෙදවීමේදි සමහර ව්‍යාපාරික අංශයේ කඩවලින් විරෝදය දැක්වූවා. ඒ සඳහා පොලීසියේ නිලධාරීන් එකතු කරගෙන රථ ගාල් සුදුසු ස්ථාන හදුනාගෙන කළ යුතු දෙයක්. මේ සඳහා ත්‍රීරෝධ රථ ලියාපදිංචි කිරිම සභාවේ අනුමැතිය මත ක්‍රමවත් වැඩපිළිවෙළක් හදන්න. මෙය හුඟක් හොඳයි. සුදුසු පරිදි සැලසුම් කරන්න.

<u>ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා</u>

බොහෝම ස්තූතියි. මෙසේ සාධනීය අදහස් දැක්වූවාට. පෙර සිදු වූ ප්‍රශ්නත් කතා කළා. ඒ අනුව තමයි අපි ඉදිරියට ක්‍රියාත්මක වෙන්නේ. ත්‍රීරෝද රථ හිමියන්ගෙන් ලැබෙන මුදලත් සභා අරමුදලට ලැබෙනවා. මේ සඳහා විනිවිද භාවයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අනුව අපි ස්ටිකර් සඳහා මුදල් යොදවන්න කටයුතු කරනවා. සුජිත් මන්ත්‍රී තුමා පැහැදිලි කළ පරිදි අපි ත්‍රී රෝද රථ සංගම් ලියාපදිංචි කරන්නේ නැහැ. අපි ලියාපදිංචි කරන්නේ ත්‍රී රෝද රථ පමණයි. ඉන්ද්‍රාවති මහත්මිය ප්‍රකාශ කළ පරිදි මීටර් සවි කරනවා නම් හොඳයි. එය ඉදිරියේදි ක්‍රියාත්මක කරන්න උත්සාහ කරමු. අමරවංශ මන්ත්‍රී තුමා ප්‍රකාශ කළ පරිදි විනය ගරුක පුද්ගලයින් ලෙස අපි ඔවුන්ව, වෙනස් කර ගමු. ඔවුන් සම්බන්ධ කරගෙන ශක්තිමත් ක්‍රමවේදයක් සකස් කරමු. ත්‍රී රෝද රථ ගාල් සම්බන්ධව සිමාවන් හා ක්‍රමවේදයන් අපි සිදු කරමු.

<u>ගරු ඩබ්.පී සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>

අපි ඔවුන්ගේ මතයට නොව අපගේ මතයන්ට අනුව අවසන් තීන්දුව සභාවක් විදිහට ගනිමු.

ඒ අනුව සභාවේ සියළු දෙනාගේ එකගතාවය මත මෙම යෝජනාව සභා සම්මත විය.

## සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව - 2025.11.28 දින මහ සභ රැස්වීම් වාර්තාව

ගරු උප සභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා විසින් තේ වේලාව වෙනුවෙන් විනාඩි 10 කට සභාව කල් තැබීමට යෝජනා කරන අතර,.එම යෝජනාව ගරු ඩී.එම්. කමල් ගුණරත්න මන්ත්‍රී තුමා විසින් ස්ථිර කරන ලදී. විනාඩි 10 න් පසුව ගරු කේ.ආර්.එම්. අමරවංශ මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව නැවත මහ සභාවක් බවට පත් කිරීමේ යෝජනාව සිදු කළ අතර එම යෝජනාව ගරු කේ.එම්. අජිත් පුෂ්ප නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

### III. පොළ භූමිය තුළ සීමා නිර්ණය කිරීම

මෙම යොජනාව ගරු උප සභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු උප සභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා</u>**

බොහෝම ස්තූතියි ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව අපි ගිය සභා වාර කිහිපයක දිම සාකච්ජා කර තීන්දුවකට ආවා. සභාව විසින් අපේ පොළ භූමි අපේ පැත්තෙන් කරන්න කලින් තිබුනේ බදු කරුවන්ට දීලා. පහුගිය දවස් වල මේ පොළ වල් අපි නිරීක්ෂණය කළා. නැවැත නැවැතත් කොහොමද අපි මේක ආරම්භ කරන්නේ කියන කාරණා සම්බන්ධයෙන් වැඩි දුර කරුණු සොයා බැලීමට. මෙහිදි පොළ භූමි ඇතුලේ ආවරණය කරන ප්‍රදේශවල වෙළෙද මහත්ම මහත්මීන් සඳහා නිසි ආකාරයේ බෙදීම් කරලා තිබෙනවා. එහිදි නිරීක්ෂණය වෙච්ච ප්‍රධාන කරුණ තමයි සංවර්ධනය කරලා තිබෙන කොටස් වල නෙවෙයි, වෙළෙන්දෝ ප්‍රිය තාවයක් දක්වන්නේ ඊට පරිබාහිර ප්‍රදේශයට. ඒ අනුව කාරණා කිහිපයක් අනුව ගත් විට නිසි මාර්ගයක් නෑ. සමහර වෙළෙන්දෝ ලොකු පරාසයක් අත්පත් කරගෙන ඉන්නවා. සමහර වෙළෙන්දෝ තෙරපිලා ඉන්නවා. මෙහිදි පාරිභෝගිකයාට හා වෙළෙන්දාට පහසු වෙනවා සීමා නිර්ණය කිරීම. නැත්නම් පාරිභෝගික ජනතාවට යන්න එන්න අපහසුයි. ඒ කරුණුත් සමග අපට අවබෝධ වුනේ සීමා ටික නිර්ණය කරලා දීලා පාරවල් ටික හරියට අපේ පැත්තෙන් හදලා වෙන්කරලා දුන්න නම් තද බදය අවම වෙනවා. පාරිභෝගිකයාට හා වෙළෙන්දාට පහසු වෙනවා. බදු එකතු කිරීමේදි ද වෙළෙන්දාට හා පාරිභෝගිකයාට හා ප්‍රාදේශීය සභාවට අසාධාරණයක් නොවෙන්න බදු ගෙවන්න පුළුවන්. අපි දිගින් දිගටම දැක්ක කාරණයක් තමයි, සියඹලාණ්ඩුවේ පමණක් නොව වෙන ප්‍රදේශවලත් උදාහරණයක් ලෙස බුත්තල ප්‍රදේශයේත් පොළ තිබුනේ පාර අයිනේ දැන් එය වෙනස් වෙලා. මහ පාරට ආසන්නව. Bus stand වල යම් වෙළඳ ප්‍රජාවක් වෙළදම් කරනවා. පාර අයිනෙත් වෙළදම් කරනවා. මෙහිදි මාර්ග අනතුරු සඳහා වැඩි ප්‍රවණතාවයක් තිබෙනවා. මෙහිදි සියඹලාණ්ඩුව පොළ දවසට සියළු වෙළෙඳුන් පොළ භූමියට රැගෙන යා හැකි නම් අපහසුතාවයන් සියල්ල වලක්වා ගැනීමට හැකි වෙනවා. මේ සඳහා සීමා නිර්ණය කටයුතු කරන්න වෙනවා . ඒ සඳහා අපට සිටින තාක්ෂණික නිලධාරීන් දෙපළ යොදා ගත යුතු වෙනවා. මෙම සීමා නිර්ණය කිරිම තුළින් පාරිභෝගික ජනතාවටත් වෙළද ප්‍රජාවටත් සේවා සැපයීම හා අපට අයවිය යුතු බදු මුදල් සාධාරණ ලෙස අය කර ගැනිමට ද හැකි වෙනවා.

ගරු සභාපතිතුමා විසින් එම යෝජනාව සම්බන්ධව විවාද අවස්ථාවට කාලය වෙන් කළ අතර ඒ සඳහා අදහස් ඉදිරිපත් කරන ලෙස සභාවට දැනුම් දෙන ලදී.

**<u>ගරු ඩී. එම්. කමල් ගුණරත්න මැතිතුමා</u>**

පල්ලේවෙල සති පොළේ දින වෙනස් කිරිමේ ගැටළුවක් තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න.
“ඒ සම්බන්ධව අපි පසුව සාකච්ඡාවට බඳුන් කරමු.” යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>එච්. එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා</u>**

සීමා නිර්ණය යටතේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙහිදි නිශ්චිත මුදලක් තිබෙනවාද ?එහෙම තිබෙනවා නම් හොදයි. එහෙම නැත්නම් මුදල තීරණය කළ යුතුයි.

**<u>කේ.එම්.ගුණරත්න මැතිතුමා</u>**

සීමා නිර්ණය කිරීම හොදයි. අපි කඩ බදු දීලා තිබුණත්, වෙනත් තැන් වල තමයි බඩු දාලා තිබෙන්නේ. එය ක්‍රමවත් කරනවා නම් හොදයි. එම මුදල් අයකිරිමේදි රිසිට් පතක් නිකුත් කරනවා නම් හොදයි.

**<u>ගරු ඩබ්.පී සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>**

පොළ භූමිය තුළ සමහර පුද්ගලයින් ඉන්නවා, එම ලබා ගත් පොළ භූමියේ කොටස් වෙනත් අයට විකුණුම් කරනවා. එම ක්‍රම වේදය දිගටම කරගෙන යන්න දෙන්න හොද නෑ. මේ සම්බන්ධව විමර්ශනය කරලා, වෙළෙඳුන් හැමදාම බඩු දානවා නම් ඔවුන්ට කොටස් දීලා ක්‍රමවත් වැඩ පිළිවෙලක් හඳුන්වා දෙනවා නම් හොදයි. අක්‍රමවත් ලෙස පාරේ බඩු විකුණන එක නතර කළ යුතුයි. එය අත්‍යවශ්‍ය කරුණකි. වෙළෙඳුන්ගේ කුට වෙළඳාම් නතර කරන්න වැඩපිළිවෙලක් සාදා සෑම දිනකම වෙළඳම් කරන අයට අවස්ථාව ලබා දි ඒ සඳහා වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය.

**<u>ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා.</u>**

සීමා නිර්ණය සම්බන්ධයෙන් කතා කරන විට අපේ අරමුණ දැනට පවතින තත්වයට වඩා වැඩි සංවර්ධනයක් සිදු කිරීමටයි. දැන් අපි එය පිළිවෙලට හා පිරිසිදුව කල යුතුයි. ඕනෑම දියුණු රටක තිබෙන සංකල්පයක් තමයි පොළ. සමහර රටවල තිබෙන බසාර් සංකල්පය හුගක් හොදයි. එය පිළිවෙලයි. පිරිසිදුයි. අපි දැන් තියෙන තත්වය ක්‍රමානුකූලව වෙනස් කරමු. මන්ද අපි ආහාර ද්‍රව්‍ය පවා ගන්නේ බිම ඉටිකොලයක තබා ගෙන සිටින එළවළු සහ පළතුරු වර්ගයි. කිසිම ස්මාර්ට් ගතියක් නෑ. පොළේ ආදායම් බදු එකතු කර ගන්න ගත්තට පස්සේ පොළේ වගකීම ඇවිත් තිබෙන්නේ ප්‍රාදේශීය සභාව විදිහට අපිට. සීමා නිර්ණය කිරීමේදි එක් වෙළෙන්දකුට වර්ග අඩි 100 ක ප්‍රමාණයක් ලබා දිය හැකිය. අවශ්‍ය ආකාරයට අපි සීමා සැකසීම් කළ යුතුය. පොළ භූමියට ඇතුළු වන ස්ථානයට වෙළෙඳුන් පැමිණිමට හුගක් උත්සාහ කරනවා. අසරණ මිනිසුන් පොල ඇතුලේ අයිනටම ගිහින් ඉන්නවා. එය ක්‍රමවත් ව සිදු කළ යුතුයි. බදු එකතු කිරිමේදි පවා අපහසු තාවයට පත් වෙයි. එබැවින් පාර්භෝගිකයාට නිදහසේ යා හැකි පරිදි පොළ සැකසිය යුතුය. නැත්නම් පපඩම් කාරයෙක් මැදින් තියාගෙන ඉන්නවා. තව එෑණු කාරයෙක් මැදින් තියාගෙන ඉන්නවා. එබැවින් පිළිවෙල කියන එක සීමා නිර්ණය ඇතුලේ කර ගත යුතුයි. අතුරු ව්‍යවස්ථාව හා ගැසට් කරලා තිබෙන විදිහට වෙළෙඳුන් හඳුනාගෙන අපි වෙන් කිරීම කළ යුතුයි. ගරු සමන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල විදිහට වෙළෙඳුන් හරි විදිහට හදුනා ගනිමු. අලුත් වෙළෙඳුන්ට අවස්ථාව ලබා දෙමු. ස්මාර්ට් පොළක් දක්වා සංවර්ධනය කිරීමට අපි ආරම්භ කරමු. සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන්න.

**<u>ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය</u>**

පොළේ එළවළු පළතුරු විකිණිමේදි ආවරණ කරන ලද කුඩා මැසි සකසා එළවළු තැබීමට තට්ටු සකසා පිරිසිදු කිරිමට හැකි වන පරිදි සකස් කරනවා නම් හොදයි. දොඹගහවෙල පොළ දැනට පාරටම ගොස් ෆාමසිය පැත්තටම ගොස් තියෙනවා. අනෙක් පැත්තෙන් නීලවබැද්ද පාර පැත්තටම ගොස් තියෙනවා. පාරේ යන ජනතාවට අවහිරතා විශාල වශයෙන් ඇතිවෙනවා. මේ නිසා වාහනවලට මාරු වීමට අපහසුයි. එබැවින් දොඹගහවෙල පොළත් පිළිවෙලට සකස් කිරීමට මම යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති පී.කේ. අසංක ඉදුනිල් මැතිතුමා</u>**

සීමා නිර්ණය සම්බන්ධයෙන් කතා කරන විට එය මගේ පැත්තෙන් ආව යෝජනාවක් නිසා, මට ඒ සම්බන්ධයෙන් නිශ්චිත කරුණු කිහිපයක් තිබෙනවා ඉදිරිපත් කරන්න. ගරු මහේෂ් මන්ත්‍රී තුමා කිව්ව පරිදි මුදල් ප්‍රමාණයන් පිළිබඳ ගැසට් මගින් ප්‍රසිද්ධ කරනවා. අපි මෙය බෙදීමට තීරණය කරලා තිබෙන්නේ. අවම බෙදුම වර්ග අඩි 50 දක්වාත්, උපරිම බෙදුම වර්ග අඩි 100 දක්වාත් සීමා කරලා තිබෙන්නේ. මාර්ග පද්ධතිය හා වෙළෙඳුන් වෙළදාම් කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම තමයි අපි කරන්නේ. මහජන තොග පොළවල් හා සිල්ලර පොළවල් අපි කරන්නේ. හඳුනාගැනීම, ලියාපදිංචිය, මිල තිරණය, මිල එකතු කිරීම, නියාමනය කිරීම, උපදේශනය කිරීම, පසු විපරම් කිරීම, කොන්දේසි පද්ධතියකට යටත් කිරීම යි. නමුත් කොන්දේසි පද්ධතියෙන් කියවෙන්නේ නෑ වෙළඳ ප්‍රජාව පමණක් කොන්දේසි පද්ධතිය යටත් වනවා කියන එක. පාරිභෝගිකයා පවා කොන්දේසි පද්ධතියට යටත් වනවා. ප්‍රාදේශීය සභාවක් විදිහට අපේ දේපළ සංවර්ධනය කරන්නේ කොහොම ද කියලා අපි ව්‍යාපෘති වාර්තාවට ඇතුලත් කරනවා. එය දෙසැම්බර් මාසයේ මහ සභාවට ඉදිරිපත් කරමු කියා ප්‍රකාශ කරනවා. පොලිසීය, මහජන සෞඛ්‍ය පරික්ෂක, ඇතුලු රාජ්‍ය ආයතන අපි සම්බන්ධ කර ගන්නවා. වෙළඳුන් මහජනතාව මේ සඳහා සම්බන්ධ කර ගන්නවා. දෙසැම්බර් මාසය අවසානය වන විට, අපි මෙය අවසන් කළ යුතුය. මහජනතාවට සහන සැලැසීම සඳහා අපි සීමා නිර්ණය කිරීමේදි පොළ භූමියෙන් භූමියට වෙන් වෙච්ච

සීමා නිර්ණයන් තමයි පාදක කර ගැනීමට වෙන්නේ. මේ සඳහා ගල්, කඹ ආදි වශයෙන් ද පින්තාරු කිරීමට අවශ්‍ය වියදම් දැරීමට සිදු වෙයි. යම් මුදලක් වැය වෙයි. අපේ අධීක්ෂණය යටතේ තාක්ෂණ නිලධාරිගේ පූර්ණ මැදිහත් වීමෙන් මෙය ක්‍රියාවට නංවනවා. ඊට පසු අපි වියදම් සාරාංශය ඉදිරිපත් කරන්නේ. පොළවල් හතර එකිනෙකට වෙනස් නිසා වියදම් දැරීම එකින් එකට වෙනස් වෙනවා.

**<u>ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා</u>**

ගරු මහේෂ් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විදිහට මුදල් අයකිරීම සිදු කරනු ලබන්නේ, ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇති ආකාරයටයි. පොළ භූමියේ මුදල් අයකිරීම පිළිබඳ සභා වාර්තාවේ 25 පිටුවේ සඳහන් වෙනවා. මෙම යෝජනාව ක්‍රමවත් කිරීමට හැමෝම අපිට ඉල්ලීම් කළා. පිළිවෙලට පිරිසිදුව සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ සඳහා සියළු දෙනාගේ සහයෝගය අවශ්‍යයි. ඒ අනුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්,මෙය සභාවේ එකගතාවය මත සභා සම්මත වෙනවා.

**06. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2025.11.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ දී සාකච්ඡාවට බඳුන්කරන ලද පහත සඳහන් යෝජනා හා අදහස් මහ සභාවේ දැනගැනීම සඳහා හා අනුමැතිය සඳහා පහත සඳහන් කර ඉදිරිපත් කරමි.**

01. 2025 ඔක්තෝම්බර් හා සැප්තැම්බර් මාස වලට අදාල කාර්ය මණ්ඩලයේ සේවකයින්ගේ අතිකාල හා නිවාඩු දින වැටුප්, එම මාස දෙකට අදාල ජල, විදුලි, දුරකථන බිල් ගෙවීම හා කඳන් කැටිය රුප්පේබැද්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම, ඇතිමලේ පොළ පිටුපස මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා බිල්පත පියවීම යන ගෙවීම් සඳහා මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. (මීට අදාල වැඩිදුර විස්තර 2025 නොවැම්බර් මාසයට අදාල වියදම් වාර්තාවේ සඳහන් වේ.)
02. කන්දඋඩපංගුව මහජන පුස්තකාලයේ නාම පුවරුව සකස් කරගැනිම සඳහා මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලබා දෙන ලදි.
03. කොටියාගල මහජන පුස්තකාලයේ අළුත්වැඩියා කරගැනීම සඳහා ආර්. එම්. රන්ජිත් සම්පත් බණ්ඩාර මහතා කළ ඉල්ලීමට අනුව එම ජායාපිටපත් යන්ත්‍රයේ වටිනාකමට වඩා වැඩි වටිනාකමක් එය අළුත්වැඩියා කිරීම සඳහා වැය වන බැවින් එම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම අනුමත නොකරන ලදී.
04. ඇතිමලේ නගරයේ පිහිටි කඩ කාමර 10 සම්බන්ධයෙන් කුලී කරුවන් විසින් කඩ කාමර කුලී අඩුකිරීම පිළිබඳ කල ඉල්ලීමට අනුව එම කඩකාමර වල තක්සේරු වටිනාකම් වල වාර්තාවක් කුලී කරුවන් වෙත යොමු කිරීමටත්, කඩ කාමර වල පිටුපස දොරක් සවිකර ගැනීම සඳහා කල ඉල්ලීමට ඒ පිළිබඳ වැඩිදුරටත් සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව ඔවුන් දැනුවත් කරන ලෙස සඳහන් කරන ලදී.
05. මානාහරණ ප්‍රදේශවාසීන් විසින් මනාහරණ වසම තුල පවතින මං මාවත් සම්බන්ධ ගැටළුට මහ සභාවට යොමු කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2025.11.17 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ දී සාකච්ඡාවට බඳුන්කරන ලද පහත සඳහන් යෝජනා හා අදහස් මහ සභාවේ දැනගැනීම සඳහා හා අනුමැතිය සඳහා පහත සඳහන් කර ඉදිරිපත් කරමි.**

01. 2025 ඔක්තෝම්බර් හා සැප්තැම්බර් මාස වලට අදාල කාර්ය මණ්ඩලයේ සේවකයින්ගේ අතිකාල හා නිවාඩු දින වැටුප්, එම මාස දෙකට අදාල ජල, විදුලි, දුරකථන බිල් ගෙවීම හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට අයත් වාහන කිහිපයක සිදුකළ අළුත්වැඩියා කිහිපයක් සඳහා ගෙවීම, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට ලබාගත් සැපයුම් හා උපකරණ වෙනුවෙන් ගෙවීම යන ව්‍යවස්ථාපිත ගෙවීම් වලට අමතරව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ සිදු කළ ගල්කඩහෙල යාය කදුරුගොඩ පදිංචි ආර්. එම්. රෝහිනී මහත්මියගේ ඉඩමේ පොදු ළිඳ ඉදිකිරීමේ කර්මාන්තය සඳහා බිල්පත පියවීම යන ගෙවීම් සඳහා මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලබාදෙන ලදී. (මීට අදාල වැඩිදුර විස්තර 2025 නොවැම්බර් මාසයට අදාල වියදම් වාර්තාවේ සඳහන් වේ.)

02. තවද 2026 වර්ෂයට සති පොළ භූමි 04 හි පොළ ගාස්තු අයකිරීම සඳහා අවශ්‍ය වන පොළ බදු ලදුපත් පොත් 50 ක් මුද්‍රනය කරගැනීමට මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

03. ඉදිරි මාස 02 සඳහා අවශ්‍ය වන ලයිෆ්බෝයි සබන් කැට 10, සන්ලයිට් සඩන් කුඩු 1kg පැකට් 15, හාප්පික් බෝතල් 500ml 10, ඉරටු ඉදල් 25ක් යන සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී.

04. 2025 වර්ෂය අවසානයේ දැනට හිග තත්වයේ පවතින පහත සඳහන් ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. රැපින් ජේපර් 10, පොලිතීන් යාර 10, අගල් 02 සෙලෝටේප් 24ක්, සාමාන්‍ය ෆයිල් කවර 200, A4 500 සුදු පැකට් 15, A4 පාට කොළ 500, තනිපැත්ත කාබන් කොළ 100, ට්‍රාන්ස්පේරන්ස් 50, පිටු 40 CR පොත් 10, පිටු 120 CR පොත් 10, පිටු 160 CR පොත් 10, පිටු 200 CR පොත් 10, SAMSUNG 2020 ටෝනර් 10ක් වේ.

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2025.11.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබද කාරක සභාවේ දී සාකච්ඡාවට බඳුන්කරන ලද පහත සඳහන් යෝජනා හා අදහස් මහසභාවේ දැනගැනීම සඳහා හා අනුමැතිය සඳහා පහත සඳහන් කර ඉදිරිපත් කරමි.**

01. 2025 නොවැම්බර් මස ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් ඇතුළු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීමටත් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වැඩසටහන යටතේ 2025 අදාහනාගාරයේ වැඩි දියුණු කිරීමේ කර්මාන්තයට අදාල කොටස් බිල්පත සඳහා ගෙවීම් අනුමත කරන ලදී.
02. සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු ඇතිමලේ කඩ කාමර වලට අදාලව නව තක්සේරු වාර්තා ලබාගැනීමට හා එම කඩ කාමර සඳහා අවශ්‍ය අතරුඳවුම කොපමණද යන්න තීරණය කිරීම සඳහා විෂයභාර නිලධාරිණිය විසින් යොමු කළ ලිපිය මහ සභාව සඳහා යොමු කිරීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.
03. දොඹගහවෙල මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ දරුවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිත රාත්‍රී කඳවුර සඳහා අවශ්‍ය වන රු.13,000.00ක මුදල ලබාදීමට අනුමත කරන ලදී.

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2025.12.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති පිළිබද කාරක සභාවේ දී සාකච්ඡාවට බඳුන්කරන ලද පහත සඳහන් යෝජනා හා අදහස් මහසභාවේ දැනගැනීම සඳහා හා අනුමැතිය සඳහා පහත සඳහන් කර ඉදිරිපත් කරමි.**

01. මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව පැවැත්වීම සඳහා මහ සභාව විසින් තීරණය කර ඇත්තේ සෑම සතියක සඳුදා දින වන අතර රටේ ඇතිවූ ආපදා තත්වය මත ගරු සභාපති තුමා ඇතුලු කමිටු සාමාජිකයන් හා නිලධාරීන් ඒ සම්බන්ධ විවිධ රාජකාරි වල යෙදීම මත එම 2025.12.01 දින කමිටුව පැවැත්වීමට නොහැකි වූ අතර ඊට පසු අගහරුවාදා දින කමිටුව පවත්වන ලදී.
02. 2025 ඔක්තෝම්බර් හා නොවැම්බර් මාස වලට අදාල කාර්ය මණ්ඩලයේ සේවකයින්ගේ අතිකාල හා නිවාඩු දින වැටුප්, නොවැම්බර් මාසටය අදාල ජල, විදුලි, දූරකථන බිල් ගෙවීම හා සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට අයත් වාහන කිහිපයක සිදුකළ අළුත්වැඩියා කිහිපයක් සඳහා ගෙවීම, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවට ලබාගත් සැපයුම් හා උපකරණ වෙනුවෙන් ගෙවීම යන ව්‍යවස්ථාපිත ගෙවීම් හා ඊට අමතරව පහත සඳහන් ගෙවීම් සඳහා අනඅමැතිය ලබා දෙන ලදී.
01. Construction of part of floor Concrete at pallewela fair -LDSP UP/MO/SPS/pt3 උප ව්‍යාපෘතියේ අත රැඳවුම් මුදල් නිදහස් කිරීම රු.482,585.21

02. Construction of Toilet Block at pallwela fair- LDSP UP/MO/SPS/pt2 උප ව්‍යාපෘතියේ අත රැඳවුම් මුදල් නිදහස් කිරීම රු.467,155.61

03. Construction of fish stall at pallewela weekly fair - LDSP UP/MO/SPS/pt3/2 උප ව්‍යාපෘතියේ අත රැඳවුම් මුදල් නිදහස් කිරීම රු.323,963.13

04. Implementation of a primary Product sales Center at regional level 2nd stage fair - LDSP UP/MO/SPS/pt3/3 උප ව්‍යාපෘතියේ අත රැඳවුම් මුදල් නිදහස් කිරීම රු.321,406.90

(මීට අදාල වැඩිදුර විස්තර 2025 දෙසැම්බර් මාසයට අදාල වියදම් වාර්තාවේ තව දුරටත් සඳහන් වේ.)

03. ඩෙංගු සතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඩෙංගු සැලැස්ම සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. 2025 දෙසැම්බර් මස 01 වන සතියෙන් ආරම්භ වි 2026 පෙබරවාරි මස අවසන් සතිය දක්වා සති 14ක් පුරාවට මෙම වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන සඳහා අවශ්‍ය වියදම් දැරීම සඳහා මෙම වර්ෂයේ ඉදිරි සති 04 සඳහා රු.50000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සඳහා කමිටුව අනුමැතිය ලබාදෙන ලදී. . (මීට අදාල වැඩිදුර විස්තර 2025 දෙසැම්බර් මාසයට අදාල වියදම් වාර්තාවේ සඳහන් වේ.)

**<u>එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා</u>**

"මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් සියළු දෙනා මේ සඳහා සහභාගි වනවාද"යන්න යි. විමසන ලදි.

**<u>ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා</u>**

මෙය සභාවේ සාකච්ජා කර තීරණය කළ පරිදි සෑම සදුදාවකම මධ්‍යහන 12.00ට පවත්වන බවත්, මේ සඳහා සහභාගි විය යුතු බවත් ය. පවසන ලදී.

## <u>07. මාසික ගෙවීම් වාර්තාව සහා සම්මත කිරීමේ අවස්ථාව</u>

**<u>ගරු ඩබ්.පී. සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>**
ලොරි බවුසරයෙන් ජලය සැපයීම සඳහා ලොකු වියදමක් වෙලා තිබෙනවා.

**<u>එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා</u>**
මාසික ගෙවීම් වාර්තාවේ ඔයිල් ලබා දීම ලෙස මිළ ගණන් දෙකක් සටහන් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව පැහැදිලි විස්තරයක් කරන්න. වෙනත් වියදම් විදිහට ලක්ෂ 12ක ප්‍රමාණයක් වියදම් වෙලා තියෙනවා. ඒ මොනවා ද?

**<u>ගරු ඩබ්.පී. සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>**
මාසික ගෙවීම් වාර්තාවේ 06 වෙනි පිටුවේ ජලබිල් පත් පියවීම ලෙස එහි සඳහන් පරිදි සියඹලාණ්ඩුව සති පොළ භූමියේ ජල බිල්පත වැඩි වී තිබෙනවා.

"සමන් මන්ත්‍රී තුමා පැවැසු පරිදි ජල බවුසරය ඇතිමලේ සති පොළට සතියට දින 02 ක් යවනවා. රිවිදනව් ආයතනයට අපි ජලය ලබා දෙනවා." ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>ගරු ඩබ්.පී. සමන් වර්ණකුලසූරිය මැතිතුමා</u>**

එය පැහැදිලිව තිබිය යුතුය. පොදු අවශ්‍යතා වෙනුවෙන් යෙදෙවුවාට කමක් නැහැ. කොන්ත්‍රාත් වලට දෙන්න එපා. ආදායම් වාර්තාව සවිස්තාරාත්මකව සකස් කරන්න.

**<u>ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා</u>**

ගරු එල් .එල්. සුජිත් කුමාර මැතිතුමා පැවැසූ පරිදි ජල සම්පත් මණ්ඩලයේ ජල බිල සම්බන්ධ ප්‍රශ්නයේ දි යාචක පිරිසක් දින ගණනක් සියඹලාණ්ඩුව සති පොළ භූමියේ සමහර දිනවල නවාතැන් ගන්නවා. ඔවුන් ජලය පරිභෝජනය කරනවා. වන්දනා නඩ වාහන නතර කරනවා.ඔවුන් ජලය ලබා ගන්නවා. ඒ සඳහා අපි සහන සැපයිය යුතුයි. මේ පිළිබඳව මෙය ක්‍රමවත් කිරීමට අපි තාක්ෂණ නිලධාරී මහත්මියට උපදෙස් දුන්නා. බැකෝලෝඩරය නඩත්තු සඳහා ඔයිල් ලබා දීමේදි වවුචර් පත් දෙකක් ඉදිරිපත් වුණා. එම අලුත් වැඩියාව සිදුකිරිමට බිල් ගෙව්වා. orenge bulb සඳහා ප්‍රසම්පාදනය කල ආයතන වලින් මිල කැඳවීම් කළා. එහිදි අපට අවම මිල කැඳවීම් ලබා දුන් ආයතනයට ගෙවීම් සිදු කළා.

## 08. වෙනත් කරුණු

**ගරු කේ. ආර්. එම්. අමරවංශ මැතිතුමා**

මම මුලින් පොළ සම්බන්ධව කතා කිරීමේදී ඈණූ කාරයා පපඩම් කාරයා ලෙස සඳහන් කළා. එයට සමා වෙන්න. මම එම ප්‍රකාශය ඉවත් කර ගන්නවා. මේ දිනවල පවතින  හදිසි ආපදා තත්වයෙන් සියඹලාණ්ඩුව කොට්ඨාසයේ එක් පුද්ගලයෙකු මිය ගොස් තිබෙනවා. අපි සංවේගය පල කරනවා මේ පිළිබඳව. එවැනි හදිසි මරණ වලක්වා ගැනීමට කටයුතු කරමු.

තව ද වාහන අලුත් වැඩියා කරනකොට එය පරිපාලන ව්‍යුහය තුළ අපහසු කාර්යක් වෙනවා. යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලයටත් වාහන අලුත් වැඩියාව සඳහා ලොකු මුදලක් අපට වියදම් කරන්න වෙලා තිබෙනවා. ගරු සභාපති තුමාට යෝජනා කරනවා මේ සම්බන්ධව සාකච්ඡාවක්  පැවැත්වීමට. පළාත් යාන්ත්‍රික ඉංජිනේරු අනුමැතිය දෙන්නේ නිශ්චිත කාරණාවලට. JCB  යන්ත්‍රයට මිළ කැඳවීමේදි අවම මිළ කැඳවීම් කරන්නේ. එහෙත් පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ නිර්දේශය දෙන්නේ වැඩි මිළ කැඳවීමට. මෙහිදි අපට යම් යම් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වෙනවා. මේ පිළිබඳව පලාත් පාලන අමාත්‍යාංශ සමග සාකච්ජා කළ යුතුය. මෙය පුළුල් සාකච්ජාවක් විය යුතුය. වාහන නඩත්තු කටයුතු සිදු කළ යුතුය. නැත්නම් අපහසුතාවයට පත් වෙනවා. මොකද මෙය ප්‍රායෝගිකව කරන්න බෑ. පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවන් අනුමැතිය දීමට කාලයක් යනවා. එහිදි විෂය නිලධාරි ද අපහසුතාවයට පත් වෙනවා. පනත් රෙගුලාසි වෙනස්  කිරීමට ඉල්ලීම් කල යුතුයි.

**ගරු ආර්.එම්. ඉන්ද්‍රාවති මැතිණිය**

ගරු සභාපතිතුමනි,  ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට වෙළදාම් කරන වෙළෙඳුන්ට සභය ලබා දෙන්න කියලා ඉල්ලීම් කරලා තිබෙනවා. ඒ අනුව වෙළෙඳුන් 05 දෙනෙකුට මෙම අවස්ථාව ලබා දි තිබෙනවා. ඒ පිළිබඳව සභාපති තුමාට ස්තුති වන්ත වෙනවා. ප්‍රදේශයේ මළ ගෙවල් සඳහා කැනපියක් හා තහඩු ටිකක් ලබා දීමට හැකි නම් හොඳයි කියා යෝජනා කරනවා. තවද ප්‍රාදේශීය සභාවේ බැනරයක් හා ජෙනරේටරයක්  ලබා දීමට හැකි නම් හොඳයි. ආපදාවට ලක් වු පුද්ගලයින් සඳහා බඩු මල්ලක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියා මම යෝජනා කරනවා. දොඹගහවෙල ප්‍රදේශයේ වීථි ලාම්පු සවිකිරීමට අපට ලබා දෙන්න. ඒ වගේම මහේෂ් මන්ත්‍රි තුමාගේ ප්‍රදේශයේ ගොඩක්ම අලි ප්‍රශ්න තියෙනවා. ඒ ප්‍රදේශයේ  වීථි ලාම්පු ටිකක් සවි කරනවා නම් හොඳයි කියා මාත් හිතනවා.

**ඩී.එම්. කමල් ගුණරත්න මැතිතුමා**

ආපදා තත්වය නිසා ගොවිදුපුර ප්‍රදේශයේ හුදකලා වෙලා තිබෙනවා. සභාවට මේ සඳහා මැදිහත් විමට හැකි නම් හොඳයි කියා මම යෝජනා කරනවා.

**කේ.එම්.ධර්මදාස බණ්ඩාර මැතිතුමා**

ආපදා තත්වය මත මහතළුගොල්ල ප්‍රදේශයේ හැඩ ඔය පිටාර ගැලීම නිසා 05 දෙනෙක් අවතැන් වුණා. ඔවුන් හේනෙන් එන්න කැමැති වුණේ නෑ. ඒ පිළිබඳව මම ප්‍රාදේශීය ලේකම් තුමිය දැනුවත් කළා. ඔවුන්ගේ අකමැත්තෙන් තමයි අපි ඔවුන් රැගෙන ආවේ. ඒ සඳහා මැදිහත් වූ සභාපති තුමාට ස්තුති වන්ත වෙනවා. මම නොදැනුවත්ම අපේ ප්‍රදේශයේ ආපදාවට ලක් වී ඇති ගස් ඉවත් කර තිබුනා. ඒ පිළිබඳවත් මා ස්තුති වන්ත වෙනවා. ආපදා තත්වය වලක්වා ගැනීම සඳහා JCB  යන්ත්‍රය හා ටිපර් රථය ලබා දිය හැකි නම් හොඳයි. අවශ්‍ය සහයෝගය අපි දෙනවා.

**ගරු ඩබ්.පී සමන් වර්ණකුලසූරිය මැතිතුමා**

කොට්ඨාසයේ තිබෙන ත්‍රී රෝද රථ ගාල් සහ පොළ භූමිය සම්බන්ධව කතා කළා. පොළ භූමියේ එළවළු හා පළතුරු විකුණන විටදි ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු නිසා මහජන සෞඛ්‍යය පරික්ෂක අපි සමග සම්බන්ධ කර ගත යුතුයි. මහජන සෞඛ්‍යය පරික්ෂක මහතාට මේ සම්බන්ධව මැදිහත් වීමට සභාපතිතුමා බලය දීලා තිබෙනවා. අපිරිසිදුව සිදු කරනු ලබන වෙළදාම් සඳහා ක්‍රියා මාර්ග ගැනීමට උපදෙස් ලබා දිය යුතුය. පොළ භූමියේ වන්දනා නඩ හා තෙලිගු ජනතාව සඳහා ජලය ලබා දීම පිළිබඳව ගැටළුවක් නෑ. මෙහි ආරක්ෂිත වැඩ පිළිවෙලක් සැකසිය යුතුය. තවද පොළ භූමියේ සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බලන්න. වන්දනා නඩ පැමිණෙන විට යම් මුදලක් අය කර ගැනීමට ක්‍රමයක් සකස් කර ගන්න. මේ සඳහා සිටින කම්කරුවන් ප්‍රමණවත්

නොමැති නම් කම්කරුවන් බඳවා ගැනිම සඳහා කටයුතු කරන්න. සභාවේ යෝජනාවක් අනුව සභා අරමුදලින් හෝ පඩි ගෙවීමට වැඩ පිළිවෙලක් සකසන්න. ගරු කේ.ආර්.එම්. අමරවංශ මන්ත්‍රී තුමා ප්‍රකාශ කල පරිදි යාන්ත්‍රික අධ්‍යක්ෂ තුමා හොඳ නිලධාරියෙක්. කාලයක් යද්දි ආණ්ඩුවේ යම් යම් ක්‍රියාමාර්ග ගැනීමේදි නිලධාරී බය වෙනවා. නිලධාරි පැත්තෙන් කටයුතු කිරිමේදි යම් යම් අපහසුතා වෙනවා. පොලීසියේ යම් යම් වැරදි කරන අයත් ඉන්නවා. නිලධාරීන් සමග විශ්වාසයෙන් කටුයතු කරමු. ආපදා තත්වය මත විශාල ව්‍යවසනයක් වෙලා තිබෙනවා. රටේ මේ තත්වය මත විශාල පිරිසක් මිය ගොස් තිබෙනවා. ඒ සඳහා කණගාටුව ප්‍රකාශ කරනවා. අසනීප වී සිටින පුද්ගලයින්ට නිරෝගී සුවය ප්‍රාර්ථනා කරනවා. ඒ අසරණ වුන අය සඳහා වැඩ පිළිවෙලක් සකසා ගෙන යම් යම් සහන සැලැසීමට ඉදිරිපත් වෙන්න කියා කියනවා. කොටියාගල ඉඩම් ප්‍රශ්නයට අක්කර 05 ගානේ හරි ඉඩම් බෙදලා දෙන්න කියලා අපි කියනවා. අපිට කිරිමට නොහැකි වැඩ ඔබ තුමාලාට කරන්න කියලා අපි කියනවා. ඔබ තුමාලා වැඩ කටයුතු කිරීමේදි උදව් කළ හැකි අවස්ථාවල අපි උදව් ලබා දෙනවා. ඉඩම් ප්‍රශ්නවලදි නිලධාරීන්ගේ යම් යම් අකාර්යක්ෂමතාවය නිසා ද මෙම වැඩ පිළිවෙලවල් කල් යන්නේ. එය නිවැරදි කරගෙන ඉදිරියට යා යුතුයි කියා මා කියනවා. ත්‍රී රෝද රථ ගාල් සංවර්ධනය කිරීමේ කටයුතු වලදි හා පොළ භූමිය සීමා

නිර්ණය කිරීමේදි ඔබට අපේ සහයෝගය ලබා දෙන්න පුළුවන්. ඉදිරි කාලයේ බල ප්‍රදේශයේ ආදාහනාගාරයේ කටයුතු අවසන් කරලා ක්‍රියාත්මක කරන්න කියා කියනවා. කොම්පෝස්ට් අංගනය තුළින් ද ජනතාවට සහන සලසන්න වැඩ පිළිවෙල කඩිනම් කරන්න යැයි මම ඉල්ලා සිටිනවා. අපි හරි දේට සහයෝගය ලබා දෙනවා.

**<u>එච්.එම්. මහේෂ් ඉන්දික බණ්ඩාර මැතිතුමා</u>**

මේ අවස්ථාවේ අපි මුහුණ දීලා තිබෙන ව්‍යයසනකාරි තත්වය මත පීඩාවට පත් ජනතාවට සභාවේ මන්ත්‍රීවරුන් විදිහට ශෝකය පල කරනවා. සභාපතිතුමා ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳ සාකච්ඡා කළා. ඉදිරියේදි ඩෙංගු උවදුර සඳහා සුදානම් වෙන්න ඕන. එවැනි දේ විය යුතුයි. පොළවල් සීමා නිර්ණය කිරීම තුලින් අවිධිමත් නගරය විධිමත් කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් උප සභාපති තුමාට ස්තුති වන්ත වෙනවා. කතාවට වඩා ක්‍රියාව වැදගත්. කසල අංගනය පිලිබඳව අපි තවම දැනුවත් නෑ. සභාව සතු වත්කම් පිළිබඳවත් අපි දැනුවත් විය යුතුයි. ඇතිමලේ කොට්ඨාසයේ මන්ත්‍රී වරයෙකු විදිහට මෝටර් ග්‍රේඩරයෙන් ප්‍රදේශයේ යම් කිසි වැඩක් කිරිමට අපි බලාපොරොත්තු වෙනවා. පැයකට රු. 5000.00 ක මුදලකට හෝ එය අපට ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. අය වැය විවාදයේදි කෙසේ වෙතත් සභාපති තුමා සමග අපි ඉන්නවා. නමුත් ඔබතුමාලා යෝජනා ක්‍රියාත්මක කරන අවස්ථාවේ අපිව මග හරිනවා. කිඹුල්ගේ අමුණ පාර සංවර්ධනය කිරිමට යෝජනා වුණා. නමුත් වෙනත් පාරක් තමයි සංවර්ධනය කරලා තිබුණේ. මේ තිබෙන ව්‍යවසනකාරි තත්වය තුළ අවශ්‍ය මොහොතක අපිව දැනුවත් කරන්න. එවැනි අවස්ථාවල අපි සහභාගි වෙනවා. ඒක අපේ වගකීමක්. අපිට හැකි පරිදි සහයෝගය දෙනවා.

**<u>ගරු කේ.එම්.වසන්ත රංජිත් කුමාර මැතිතුමා</u>**

මහේෂ් මන්ත්‍රීතුමා කළ යෝජනාවට මමත් එකඟ වෙනවා. රු. 5000.00 ක මුදලකට අපි වුණත් කැමැති බැකෝලෝඩරය මුදල් ගෙවා ලබා ගන්න. කොට්ඨාසය තුල වීථි ලාම්පු සංවර්ධනය සඳහා එක් විදුලි කාර්මික මහතෙකු ප්‍රමාණවත් නෑ. තවත් කෙනෙකු යොදවා ගැනීමට හැකි නම් හොඳයි. මගේ ප්‍රදේශයේ පාරවල් සැකසීමට පුද්ගලික මුදලින් හරි ජනතාවට වැඩ කරන්න ලබා දිය හැකි බැවින්,ඒ සඳහා උදව් ලබා දෙන්න කියා මා ප්‍රකාශ කරනවා.

**<u>කේ.එම්. ගුණරත්න මැතිතුමා</u>**

ආපදාවට ලක් වු සියළු දෙනා වෙනුවෙන් මම බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. මහකළුගොල්ල පාසල අසල ජලය සැකසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න. පළාත් පාලන සතිය තුළ මම සහයෝගය ලබා දුන්නා. යොවුන් සේනාංකය වැඩ සටහනේ දි සභාපති තුමා සමග සිටින ඡායාරූපයක් ලබා ගෙන අපේ පක්ෂ කාර්යාලයට යවලා තිබුණා. මා එහිදි පක්ෂ දේශපාලනයක් කළේ නෑ. මම අත්දැකීමක් හා සහයෝගයක් ලබා ගන්න පුළුවන් අවස්ථාවලට මම සහභාගි වෙනවා. සභාපතිතුමා සහතිකයක් ලබා ගත් අවස්ථාවක ඡායාරූපයක් යවලා තිබුණා. ඒ ගැන කණගාටු වෙනවා.

**ගරු උප සභාපති පී.කේ. අසංක ඉඳුනිල් මැතිතුමා.**

පවත්නා අයහපත් කාලගුණය මත ලංකාවේ මිය ගිය අය වෙනුවෙන් පක්ෂයක් විදිහට හා ප්‍රාදේශීය සභාවේ අප සැමගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඉදිරි කාලයේ අපි බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වෙනවා. ඉදිරියේදි අපිට පැය 24 ම කාර්යය මණ්ඩලයත් සමග වැඩ කිරීමට සිදු වේවි. මානාහරණ ප්‍රදේශයේ ලබා දුන්න සංදේශය පිළිබඳව කතා කළා. වර්ග ප්‍රමාණයෙන් කුඩාම ප්‍රදේශයක්. මාර්ග වලින් අඩු සංවර්ධනයක් දැක ගත හැකිය.මෙම නියමු ව්‍යාපෘතියක් කිරීමට සුදුසුම වසම මානාහරණයි. ඩෙංගු මර්ධනය පිළිබඳව සභාපති තුමා කතා කළා. එතුමා නිරන්තරයෙන් අධීක්ෂණය කරමින් අපිට වැඩ පවරමින් ක්‍රියාමාර්ග ආරම්භ කළා. සියළු රාජ්‍ය ආයතන එකතු කරගෙන අපි සාකච්ජා කළා. බුද්ධම, සියඹලාණ්ඩුව, ඇතිමලේ ප්‍රදේශ සඳහා වැඩි අවදානයක් යොමු කරන්න වෙයි. අපි 24 දෙනාම එකතු වෙලා මේ ප්‍රදේශ සංවර්ධනය සඳහා සෘජුව මැදිහත් වෙන එක. ඒක අපේ වගකීම. ස්තුති කරන්න ඕන අමරවංශ මන්ත්‍රී තුමාට. තමන් අතින් වුණ වැරැද්දට සමාව ගැනීම හා නිවැරදි කිරිම සම්බන්ධව. මහ සභාව ඉතාම ගෞරවනීය තැනැක්. අපි සියළු දෙනා සියළු දෙනාටම ගෞරව කරමු. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට මූල්‍ය බලතල පැවැරී මේදි අදහස් දක්වන්න ඕන සහ සභාවට මූල්‍ය බලතල හිමි වෙලා තිබෙන්නේ අනවබෝධය හා අවධානය යොමු නොකිරීම නිසා. කලින්ට අනුව නොව මූල්‍ය බලතල කාරක සභාවට, පනත ප්‍රකාරව ලබා දීලා තිබෙනවා. සභාව වගේම මුදල් කාරක සභාවේදි සණ පූර්ණය තිබෙන්න ඕන. ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ. සියඹලාණ්ඩුව පොලෙහි ජල අක්‍රමවත් පරිභෝජනය සම්බන්ධව මහේෂ් මන්ත්‍රී තුමා කිව්ව විදිහට අපිට තිබෙන්නේ අවිධිමත් නගරයක්. එහිදි ප්‍රජාවට, සංචාරකයන්ට සහන සලසන්න තැනැක් නෑ. ඒ සඳහා අපිට පොළ භූමිය දෙන්න වෙලා තිබෙනවා. වැඩි කාලයක් යන්නට මත්තෙන් අපිට ඒ සඳහා ස්ථානයක් ලැබේවි. වීථි ලාම්පු සම්බන්ධව ප්‍රශ්නයේදි ගැටෙමින් එක්වෙමින් සභාපතිතුමා සමග කටයුතු කළා. පසුගිය කාලය පුරා බල්බ් විශාල ප්‍රමාණයක් දාලා තිබෙනවා. ආර්ථික අර්බුද නිසා අපි හිතන වේගයෙන් අලුත් වැඩියා කරන්න බෑ. අපි ගනු ලැබූ තීන්දු තීරන එක්ක අක්‍රීය බල්බ් ක්‍රියාකාරි කලාට පස්සේ ඉදිරියට නඩත්තු කටයුතු තමයි තිබෙන්නේ. එය අපහසු නොවේවි. ඉදිරි වර්ෂය තුළත් අපි ලක්ෂ 05 කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. orange සමාගමේ බෙදා හරින්නන්ගේ ආයතනය තිබෙන්නේ බුත්තල. ඒ ආයතනයටත් වඩා අඩු මුදලකට රංජිත් ඉලෙක්ට්‍රොනික් එකෙන් බල්බ් ගන්න අපිට පුළුවන් වුණා. අපි ප්‍රශ්න සිද්ධි විදිහට බලන්නෙ නෑ. එහි තිරසාර විසඳුම විතරයි බලන්නේ. සමහර තීන්දු තීරණ ගැනීමේදි සුළු කොට්ඨාසයක් අසතුටු වෙන්න පුළුවන්. ත්‍රී රෝද රථ ගාල් සම්බන්ධව අපිට ප්‍රශ්න එයි. අපි හෙමිහිට විසඳ ගමු. මහේෂ් මන්ත්‍රී තුමා කිව්ව විදිහට ශ්‍රී පාලි මහ විද්‍යාලය ඉදිරිපිට කාණු පද්ධතිය බැලුවේ මම. ඉදිරියේදි එය සිදු වේවි.

අපි සභාවක් විදිහට කොහොම ද ගනුදෙනු කරන්නේ කියලා පුහුණු සැසි වලදි සාකච්ජා කළා. ඒ සඳහා කිහිප දෙනෙකු පමණයි සහභාගි වුණේ. ඒ නිසා අපේ සමහර යෝජනා කරද්දි සමහර වැරදීම් වෙන්නේ. න්‍යාය පත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා තුළ තමයි තීන්දු තීරණ ගත යුත්තේ.
ප්‍රාදේශිය සභාවේ අධිකාර ගැන කතා කළා. රීති හා පනත් වල තිබෙනවා අපි කටයුතු කරන්නේ කොහොමද කියලා. ඉදිරියේදි කටයුතු කිරීමේ දි වැදගත් වේවි. අපි ඇවිල්ලා තිබෙන්නේ මහජනතාවට වැඩ කරන්න. අපි හැකි පළමු වැනි අවස්ථාවේම ප්‍රාදේශීය සභාව නගර සභාවක් බවට පත් කිරීම තමයි කළ යුත්තේ. සිදු වූ ආපදා තත්වයට ශෝකය හා කණගාටුව පල කරනවා.

**ගරු සභාපති ඩබ්.වී. සුසන්ත ප්‍රදීප් කුමාර මැතිතුමා**

අද දින සිදු කළ සාකච්ජාවලට අනතුරුව සිදු කළ යුතු මාගේ කතාව ආරම්භ කරනවා. මේ අනුව සභාව පවත්වාගෙන යන්න තිබෙනවා. යම් යම් ගැටළු කාරි තත්වයන්ට අපි මුහුණ දුන්නා. එය වෙනස් කර ගැනීම ගැන සතුටුයි. අපි ආපදා තත්වය මත විශාල ව්‍යවසනයකට ලක් වෙලා තිබෙනවා. බුත්තල, බඩල්කුඹුර, මැදගම, මඩුල්ල ජනතාව දුකට පත් වෙලා. ජනාධිපති තුමා අද ආපදා කටයුතු සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනිමට රැස්වෙලා තිබෙනවා. ඒ අනුව ඉතා ඉක්මනින් ක්‍රියාමාර්ග ගැනීමට අපව දැනුවත් කරයි. අපේ ගෲප් එකෙත් දැනුවත් වෙන්න. ගෲප් එකට ඔබගේ දැනුවත් කිරීම් කරන්න. පළාත් පාලන සතිය තුළ අපි එකතු වෙලා කටයුතු කළා. ඒ පිළිබඳව ගුණරත්න මන්ත්‍රී තුමාට සිදු වුණු අපහසුතාවය ගැන කණගාටු වෙනවා. ඒ අවස්ථාවල අපගේ දේශපාලන න්‍යාය පත්‍රය එතැනට යොදවා ගත්තේ නැහැ. ඒ වැඩ පිළිවෙල ජාතික වැඩ සටහනක්. එතැනින්

එහාට අපි එකට වැඩ කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. අයවැය අවස්ථාවේදී ද අපි ඒ ගැන විශ්වාස කළා. ඔබ මුලින්ම මුදල් අවශ්‍ය බව දැනුවත් කරන්න තිබුණා. අපි කාටවත් බලපෑම් කළේ නෑ. අත්දැකීම් බහුල මන්ත්‍රී තුමන්ලා හිටියා. අනෙක් අය අලුත් අයයි.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇතිවිය.

අපි කැමැතියි එකතු වෙලා කටයුතු කරන්න. ඒ අවස්ථාවලදි අපට ප්‍රශ්න එනවා. ගුණරත්න මන්ත්‍රී තුමා ඒ අවස්ථාවලදි පක්ෂ දේශපාලනයක් කළේ නැහැ. එතුමා ඒ අවස්ථාවල දි සිදු වූ අපහසුතාවය පිළිබඳ කණගාටු වෙනවා. කොටියාගල ඉඩම් ප්‍රශ්නය පිළිබඳ ජාතික තීරණය අපට තිබෙනවා. ඉඩම් අහිමි වන අයට වන්දි ගෙවන්න ජනාධිපති තුමා තීරණය කරලා තිබෙනවා. සෑම ගොවියෙකුටම ඉඩම් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ ජාතික වැඩ පිළිවෙලක්. මෝටර් ග්‍රේඩරය ගැන කතා කළා. ඉදිරි වසරේ මුල අපි මේ සඳහා මැදිහත් වෙමු. අපිට හැකි ඉක්මනින් ම මෝටර් ග්‍රේඩරයක් ලැබේ. පෞද්ගලික මුදලින් කරන්න කියලා නෑ. අපි කරමු කොහොම හරි. පොඩි කාලයක් යයි. මගේ ප්‍රදේශයටවත් මෙම ආපදා අවස්ථාවල මෝටර් ග්‍රේඩරයක් යැව්වේ නෑ. කිඹුල්ගේ ආර සඳහා ලක්ෂ 25 ක් ගිහින් නෑ. ගොවි සංවිධානවලට ලක්ෂ 20යි වියදම් කරන්න පුළුවන්. කිඹුල්ගේ ආර පාර අවස්ථා කිහිපයකදි සංවර්ධනය වෙලා තිබෙනවා. ජනතාවගේ වැඩි ඉල්ලීමකට අනෙක් පටු පාරක් හැදුවේ. කිඹුල්ගේ ආර පාර පළල් ප්‍රධාන පාරක්. එය ඉදිරියේදි සකස් කරමු. තණකොළ කපන යන්ත්‍රය ලබා දෙන්න ඉල්ලීම් කළා. රංජිත් මන්ත්‍රි තුමා කිව්ව විදිහට තාක්ෂණික පැත්තෙන් පාර කපන්න බැහැ කියලා කිව්වා. ඩෙංගු මර්ධන වැඩ සටහන සඳහා ඔබට අපි ලිපි යොමු කරනවා. රාජ්‍ය නිලධාරීන් එකතු වෙලා කරන වැඩ සටහනක් මෙය. ඒ අවස්ථාවේදි ඔබට පුළුවන් නම් තණකොළ කපන යන්ත්‍ර ඇති පුද්ගලයන් ටිකක් එකතු කර ගන්න. අපිට පුළුවන් ඒ සඳහා තෙල් ටික ලබා දෙන්න. එවැනි අවස්ථාවන් සකස් කර ගමු. බෝතල්, ප්ලාස්ටික් වැනි සියළු දේ අපිට ඒ අවස්ථාවෙම එකතු කර ගත හැකිය. ආපදා තත්වයන්ට සහන සලසන්න රජය මැදිහත් වෙනවා. ඔබත් අපිත් සහයෝගය ලබා දෙමු. සියලු දෙනාට ඉදිරියේදි මහජන සේවය කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවා.අද දින පැමිණි සියළු දෙනාට ස්තුතිය පල කරන අතර. ඉන් අනතුරුව සභාවේ කටයුතු නිමා කරන ලදි.

ඩබ්.වී සුසන්ත ප්‍රදිප් කුමාර,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව